GMOA
ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

09-09-2011

පුවත්පත් නිවේදනය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් ගරු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා මාලඹේ පිහිටි සවුත් එසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් (SAITM) ආයතනයට උපාධි පිරිනැමීමේ තත්ත්වයක් පිරිනමා ඇත. එම ගැසට් පත්‍රයේ උපලේඛනයේ කොන්දේසි වශයෙන්(කොන්දෙසි අංක 05) මාස 06ක් ඇතුලත මහාචාර්ය ඒකක ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 600ක ණය මුදලක් ලබා ගන්නා ලෙස දක්වා ඇත.

> *5.මෙම නියමය බලාත්මක වීමේ දින සිට මාස හයක් ඇතුලත මහාචාර්ය ඒකක ඉදිකිරීමේ කර්යය සඳහා ඉදිකිරීම් ණයක් වශයේන් රුපියල් මිලියන හයසියයක්:රුපියල්(600,000,000/-) ණයට ගැනීම සම්බන්ධයෙන් ලංකා බැංකුව විසින් නිකුත් කරන ලද අර්පන ලිපිය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.*

SAITM ආයතනයේ වෙබ් අඩවිය පිරික්සීමේ දී අධ්‍යක්ෂකවරයා වශයෙන් වෛද්‍ය මහාචාර්ය නෙවිල් ප්‍රනාන්දු නැමැති පුද්ගලයාගේ නම සඳහන් වේ ( http://www.saitm.edu.lk)

අප දන්නා පරිදි  මෙම පුද්ගලයා වයස 70ක් ඉක්ම වූ පුද්ගලයෙක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 2010(1)211 වගන්තිය යටතේ වසස  හැත්තෑවට එළඹි ඇති කිසිම පුද්ගලයෙකුට සමාගමක අධ්‍යක්ෂක ධුරය දැරිය නොහැක.

> *210. (1) 211 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව,වයස අවුරුදු හැත්තෑවට එළඹි ඇති කිසිම තැනැත්තෙකු, පොදු සමාගමක අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් හෝ පොදු සමාගමක පාලිත සමාගමක් වන පෞද්ගලික සමාගමක අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් හෝ පත් කල නොහැකි වන්නේය.*

එබැවින්  මෙවැනි  අති විශාල මුදලක් සමාගම් විධිවිධාන වලට පටහැනිව ලබා දීමට කටයුතු කිරීම මගින් වගකිවයුතු අමාත්‍යවරයෙකු වශයෙන් සිදුකර ඇති ක්‍රියාකලාපය අපි තරයේ හෙලා දකිමු.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්.